# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1996 අංක 22 දරන
# තුවක්කු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1996 අගෝස්තු මස 21 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 අගෝස්තු මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : රු. 1.20 යි. තැපැල් ගාස්තුව : රු. 2.55 යි.

## 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1996 අගෝස්තු මස 21 වන දින.]

එල්.ඩී.—ඕ. 54/94

**තුවක්කු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 1996 අංක 22 දරන තුවක්කු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

182 වන අධිකාරයේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. මෙහි මින් මතු ප්‍රධාන ප්‍රඥප්තිය යනුවෙන් සඳහන් කරනු ලබන, තුවක්කු ආඥාපනතේ 2 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "කෘෂිකාර්මික කාර්ය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් අර්ථ කථනය එකතු කිරීමෙන්:—

"ස්වයංක්‍රිය තුවක්කුව" යන්නෙන් තුවක්කුව පත්තු කිරීමේ දී හැවත හැවතත් හිස් පතරොම් කොපුවක් බැහැර කර අලුත් පතරොමක් ඇතුල් කරන තුවක්කුවක් අදහස් වේ;

(2) "දිසාපතිවරයා" යන්නෙහි අර්ථ කථනය ඉවත් කිරීමෙන් ;

(3) "තුවක්කුව" යන්නෙහි අර්ථ කථනයේ (ඇ) ඡේදය වෙනුවට මෙහි පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඇ) යම් හිංසක ද්‍රව්‍යයක් මුදාහැරීම සඳහා සකස් කර ඇති හෝ යොදා ගන්නා කවර හෝ විස්තරයකට අයත් යම් ආයුධයක්, මෙයට වායු තුවක්කුවක් ඇතුළත් නොවේ." ;

(4) "බලපත්‍ර අධිකාරී" යන්නෙහි අර්ථ කථනය වෙනුවට මෙහි පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන්:—

"බලපත්‍ර අධිකාරී" යන්නෙන් ලේකම්වරයා අදහස් වේ;

(5) "සාම නිලධරයා" යන්නෙහි අර්ථ කථනය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන්:—

"සාම නිලධරයා" යන්නට යම් පොලිස් නිලධරයෙක් සහ පොලිස් රාජකාරී ඉටුකිරීම සඳහා ලියවිල්ලක් මගින් පත් කරන ලද යම් ග්‍රාම නිලධරයෙක් ඇතුළත් වේ;

(6) "සාම නිලධරයා" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම, මෙහි පහත දැක්වෙන අලුත් අර්ථ කථනය එකතු කිරීමෙන්:—

"ලේකම්වරයා" යන්නෙන්, රාජ්‍ය ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය එහි "දිසාපතිවරයා" යන වචනය යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "ලේකම්වරයා" යන වචනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, එහි " රුපියලක මුද්දර ගාස්තුවක් " යන වචන වෙනුවට " රුපියල් දහයක මුද්දර ගාස්තුවක් " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද වෙනුවට පිළිවෙලින් මෙහි පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්:—

"(අ) ශ්‍රී ලංකාවට ඇතුළුවන කවර හෝ අනුමත වරායක් ඔස්සේ ; හෝ

(ආ) ශ්‍රී ලංකාවට ඇතුළුවන යම් අනුමත වරායකට පැමිණෙන මගීන් විසින් ඔවුන්ගේ පෞද්ගලික ගමන් බඩුවල කොටසක් වශයෙන් " ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ, "රුපියල් එක්දහසක" යන වචනයේ සිට එම උපවගන්තියේ අවසානය තෙක් වූ කොටස ඉවත් කොට, ඒ වෙනුවට " රුපියල් දසදහසක දඩයක් හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේය. " යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ, "පොලිස් නිලධරයන්" යන වචන වෙනුවට " ලේකම්වරයා " යන වචනය ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ, " ප්‍රකාශයක් කර " යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා කොටස ඉවත් කර ඒ වෙනුවට " ඔහු විසින් රේගු බලධාරීන්ට 'අ' උපලේඛනයේ ආ2 ආකෘතිපත්‍රයට සාරානුකූලව ප්‍රකාශයක් කර, ලේකම්වරයාගෙන් එම ආකෘති පත්‍රයට සාරානුකූලව ඇති අවසර පත්‍රයක් ලබාගැනීමෙන් පසුව මිස රේගු පරිශ්‍රයෙන් ඉවත් කර නොගත යුතු ය. " යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

මගීන් විසින් ආනයනය කිරීම.

11. ස්වකීය ගමන් බඩුවල කොටසක් ලෙස තුවක්කුවක් ආනයනය කරන යම් මගියකු විසින්, ප්‍රකාශයක් කර ලේකම්වරයාගෙන් 'අ' උපලේඛනයේ 'ආ' ආකෘතිපත්‍රයට සාරානුකූල අවසරපත්‍රයක් ලබාගෙන ඇත්නම් මිස, ඒ තුවක්කුව රේගු පරිශ්‍රයෙන් ඉවතට ගෙන නොයා යුතු අතර, එවැනි අවසර පත්‍රයක්,

නොමැතිව හෝ මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව හැර එවැනි තුවක්කුවක් රේගු පරිශ්‍රයෙන් ඉවතට ගෙන යන කවර හෝ තැනැත්තෙක් මේ ආඥා පනතට විරුද්ධව වරදක් කරන්නේ ය. ".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:—

" (1) කිසිම තැනැත්තකු විසින්, ලේකම්වරයාගෙන් ලබා ගත් බලපත්‍රයක් නොමැතිව, යම් තුවක්කුවක් විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ තැබීම නොකළ යුතු ය. " ;

(2) ඒ වගන්තියේ (2) වන උප වගන්තියේ, "රුපියල් හැටක මුද්දරයක්" යන වචන වෙනුවට " රුපියල් පන්සියයක මුද්දරයක් " යන වචන ආදේශ කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය එහි (3) වන උපවගන්තියේ " කිට්ටුම පොලිස් අධිකාරිවරයා" යන වචනවල සිට අවසානය දක්වා ඇති කොටස වෙනුවට " විකිණීමේ දින සිට දවස් තුනක් ඇතුළත බලපත්‍ර අධිකාරිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ " එවැනි සෑම අවසර පත්‍රයක්ම " යන වචන වෙනුවට "එවැනි සෑම අවසර පත්‍රයක්ම රුපියල් පණහක ගාස්තුවක් ගෙවීම මත නිකුත් කරනු ලැබිය යුතු අතර එය " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ " දිසාපතිවරයාගෙන් " යන වචන වෙනුවට " බලපත්‍ර අධිකාරිවරයාගෙන් " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ " රුපියල් හැටක මුද්දරයක් " යන වචන වෙනුවට " රුපියල් පන්සියයක මුද්දරයක් " යන වචන ආදේශ කිරීමෙන්.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය මෙහි පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ " රුපියල් දහයක මුද්දරයක් " යන වචන වෙනුවට " රුපියල් පන්සියයක මුද්දරයක් " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ " ප්‍රාදේශීය බලපත්‍ර අධිකාරිවරයා " යන වචන වෙනුවට " බලපත්‍ර අධිකාරිවරයා " යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය, මෙහි පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ—

(අ) (ඌ) ඡේදය වෙනුවට මෙහි පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඌ) කෞතුක භාණ්ඩයක් වශයෙන් හෝ සැරසිලි භාණ්ඩයක් වශයෙන් හෝ තබා ගන්නා වූ යම් පැරණි, අභාවිත හෝ පාවිච්චි කළ නොහැකි තුවක්කුවක් බවට බලපත්‍ර අධිකාරිවරයා විසින් සහතික කර ඇත්තා වූ යම් තුවක්කුවක් සන්තකයේ තබා ගැනීම ;"; සහ

(ආ) ඒ උපවගන්තියේ (i) වන ඡේදයේ "පොලිස්පතිවරයාගේ" යන වචනය වෙනුවට "ලේකම්වරයාගේ" යන වචනය ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට මෙහි පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) මේ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙක් මේ ආඥාපනතට විරුද්ධව වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට—

(අ) ඒ වරද පළමුවන වතාවට කළ විට, රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයක් බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.

(ආ) ඒ වරද දෙවන වරට හෝ ඉන්පසුව කළ විට අවුරුදු දහයකට නොඅඩු හා අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් බරපතල වැඩ ඇතිව බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් වන්නේ ය :

එසේ වුවද ඒ වරද ස්වයංක්‍රීය තුවක්කුවක් හෝ රිපීටර් ශොට්ගන් තුවක්කුවක් භාරයේ හෝ සන්තකයේ තබා ගැනීමෙන් හෝ පාවිච්චි කිරීමෙන් සමන්විත වන අවස්ථාවක, වරදකරු ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කරනු ලැබීමෙන් දඬුවම් කළ යුතු ය :

එසේම තවදුරටත්, ඒ වරද සරල කාණු (ස්මූත් බෝර්) සහිත, පුරවන වර්ගයේ (මසල් ලෝඩිං) ශොට්ගන් තුවක්කුවක් භාරයේ හෝ සන්තකයේ තබා ගැනීමෙන් හෝ පාවිච්චි කිරීමෙන් සමන්විත වන අවස්ථාවක, 44 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි, ඒ වරද සම්බන්ධයෙන් දඬුවම් කළ යුතු ය. " ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම, මෙහි පහත දක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(4) මේ වගන්තිය යටතේ වූ සෑම වරදක්ම, ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබීමෙන් පසු, ඒ වරද (22 වන අධිකාරය වූ) අපරාධ වැළැක්වීමේ ආඥාපනත යටතේ ඇඟිලි සලකුණු ගත හැකි වැරදි පිළිබඳ උපලේඛනයේ ඇතුළත් වූවාක් මෙන්, ඇඟිලි සලකුණු ගත හැකි විය යුතු ය. ".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ " බලපත්‍ර අධිකාරි විසින් ඉන් පසුව " යන වචන වෙනුවට " බලපත්‍ර අධිකාරි විසින් ඉන් පසුව, එම තුවක්කුව පාවිච්චි කිරීමට අවශ්‍ය නිපුණත්වය අයදුම්කරුට තිබෙන බවට සෑහීමට පත්වීමෙන් පසු " යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය, " මෙහි පහත දක්වෙන චක්‍රය අනුව, මුද්දර මඟින් ගෙවිය යුතු වාර්ෂික බද්දක් අය කළ යුතු ය." යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති කොටස වෙනුවට මෙහි පහත දක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම.

" මෙහි පහත දක්වෙන චක්‍රය අනුව ගෙවිය යුතු වාර්ෂික බද්දක් අය කළ යුතු ය.

| | කෘෂි කාර්මික කාර්ය සඳහා රු. | ශ. | කෘෂි කාර්මික නොවන කාර්ය සඳහා රු. | ශ. |
|---|---|---|---|---|
| (අ) සෑම පුරවන (මසල් ලෝඩිං) තුවක් කුවක් සඳහා | 50 | 00... | 100 | 00 |
| (ආ) සෑම කඩන (බ්‍රීච් ලෝඩිං) තුවක්කුවක් සඳහා | 100 | 00... | 200 | 00 |
| (ඇ) සෑම රයිෆලයක් සඳහා | 500 | 00... | 1,000 | 00 |
| (ඈ) සෑම පිස්තෝලයක් හෝ රිවෝල්වරයක් සඳහා | 1,000 | 00... | 2,000 | 00 |
| (ඉ) තුවක්කු බලපත්‍රයක් නැවත නිකුත් කිරීම සඳහා | 10 | 00... | 10 | 00" |

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, මෙහි පහත දක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"අභියාචනා. 25. (1) මේ ආඥාපනත යටතේ අවසර පත්‍රයක් හෝ බලපත්‍රයක් නිකුත් කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමේ බලපත්‍ර අධිකාරිවරයාගේ තීරණයකට එරෙහිව, අමාත්‍යවරයා විසින් තත් කාර්යය සඳහා පත් කරන තැනැත්තන් තුන් දෙනකුගෙන් සමන්විත සමාලෝචන මණ්ඩලයක් වෙත අභියාචනයක් කළ හැකි ය. ඔවුන් අතුරෙන් එක් තැනැත්තකු දිසා අධිකරණ මට්ටමේ හෝ ඊට ඉහළ අධිකරණයක විශ්‍රාමලත් විනිශ්චයකාරවරයකු ද එක් තැනැත්තකු ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නිලයට පහළ තනතුරක් නොවන තනතුරක් දරා ඇති විශ්‍රාමලත් පොලිස් නිලධරයකු ද එක් තැනැත්තකු ශ්‍රී ලංකා පරිපාලන සේවයෙන් විශ්‍රාමලත් නිලධරයකු ද විය යුතු ය. එම විශ්‍රාමලත් විනිශ්චයකාරවරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු ය.

(2) මේ ආඥාපනත යටතේ තුවක්කුවක් සන්තකයේ තබාගැනීම සඳහා යම් තැනැත්තකුට බලපත්‍රයක් නිකුත් කිරීමට අවසර දෙන බලපත්‍ර අධිකාරිවරයාගේ තීරණයකට එරෙහිව, නියෝජ්‍ය පොලිස්පති නිලයට පහළ නිලයක් නොවන නිලයක් දරන යම් නිලධරයකු විසින් සමාලෝචන මණ්ඩලය වෙත අභියාචනය කළ හැකි ය.

(3) මේ වගන්තිය යටතේ වූ අභියාචනයක් සම්බන්ධයෙන් සමාලෝචන මණ්ඩලයේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(4) මේ වගන්තිය යටතේ වූ අභියාචන විභාග කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි අතර, එවැනි අභියාචන ඉදිරිපත් කළ යුතු කාලය සහ ඉදිරිපත් කළ යුතු ආකාරය ද ඒ අභියාචන සඳහා ගෙවිය යුතු ගාස්තු හා ඒ අභියාචන විභාග කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ද සම්බන්ධයෙන් ඒ නියෝග මගින් විධිවිධාන යොදනු ලැබිය හැකි ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට මෙහි පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) 25 (2) වන වගන්තිය යටතේ සමාලෝචන මණ්ඩලය වෙත කරන ලද අභියාචනයක් මත බලපත්‍රයක් නිකුත් කිරීමට අවසර දීමේ බලපත්‍ර අධිකාරිවරයාගේ තීරණය සමාලෝචන මණ්ඩලය විසින් ප්‍රතිවර්තනය කරනු ලබන අවස්ථාවක, එම බලපත්‍රය නිකුත් කරනු ලැබූ තැනැත්තාට, එම මණ්ඩලය විසින් තම තීරණය ලිඛිත නිවේදනයක් මගින් දනුම් දී, ඒ නිවේදනයේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත එම බලපත්‍රය, බලපත්‍ර අධිකාරිවරයා වෙත එවන ලෙස ඒ තැනැත්තාට නියම කළ යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"බලපත්‍ර ලේඛනය.

27. බලපත්‍ර අධිකාරිවරයා විසින් තත් කාර්ය සඳහා " අ " උපලේඛනයේ " ග " ආකෘතියට සාරානුකූලව තබා ගන්නා පොතක, සියලුම තුවක්කු බලපත්‍ර පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම)

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය, එහි " ඒ තුවක්කුව මහ රැජිණිය වෙත රාජසන්තක කළ යුතු ය " යන වචන වෙනුවට " ඒ තුවක්කුව රජය සතු කළ යුතු ය. එසේ රාජසන්තක කරනු ලැබූ විට, ඒ තුවක්කුවේ අයිතිකරුව සිටි තැනැත්තා, බලපත්‍ර අධිකාරිවරයා විසින් තත් කාර්ය සඳහා පත් කරන ලද නිසි තැනැත්තකු විසින් තක්සේරු කරන ලද පරිදි ඒ තුවක්කුවේ වටිනාකමට සමාන මුදල් ප්‍රමාණයක වන්දියක් ලැබීමට හිමිකම් ලබන්නේ ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ " දිසාපතිවරයා " යන වචනය යෙදෙන සෑම තැනකම, ඒ වෙනුවට " බලපත්‍ර අධිකාරිවරයා " යන වචන ආදේශ කිරීමෙන්.

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (1) සෑම බලපත්‍රධාරියකුම, තමාට තුවක්කු බලපත්‍රයක් නිකුත් කර ඇත්තේ යම් තුවක්කුවක් සම්බන්ධයෙන් ද, ඒ තුවක්කුව විනාශවීම හෝ නැතිවීම සම්බන්ධයෙන්, එය සිදු වී දවස් හතක් ඇතුළත, බලපත්‍ර අධිකාරිවරයා වෙත වාර්තා කළ යුතු ය. ".

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ " දිසාපතිවරයා " යන වචනය යෙදෙන සෑම තැනකම, ඒ වෙනුවට " බලපත්‍ර අධිකාරිවරයා " යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "ඒ සෑම අවසර පත්‍රයක්ම, 'අ' උපලේඛනයේ ' ච ' ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු ය ". යන වචන වෙනුවට " ඒ සෑම අවසර පත්‍රයක්ම රුපියල් දහයක ගාස්තුවක් ගෙවූ විට නිකුත් කළ යුතු අතර ඒ අවසර පත්‍රය ' අ ' උපලේඛනයේ ' ච ' ආකෘති පත්‍රයට සාරානුකූල විය යුතු ය. " යන වචන ආදේශ කිරීමෙන්.

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ " දිසාපතිවරයා " යන වචනය යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට " ඒ නියමය අදාළ වන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ, "පොලිස්පතිවරයා " යන වචනය වෙනුවට " ලේකම්වරයා " යන වචනය ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ, "එම පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපතිවරයා " යන වචන වෙනුවට " ලේකම්වරයා " යන වචනය ආදේශ කිරීමෙන්.

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය, එහි " දිසාපතිවරයා " යන වචනය වෙනුවට " පොලිස් අධිකාරිවරයා " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය, එහි " දිසාපතිවරයා හෝ ඔහු විසින් ඒ කාර්ය සඳහා දිසාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් නිලධරයකු විසින් " යන වචන වෙනුවට සහ " කිට්ටුම පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධරයා වෙත" යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය තෙක් වූ කොටස වෙනුවට, පිළිවෙළින් " පොලිස් අධිකාරීවරයා හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් නිලධරයකු විසින්" යන වචන සහ " කිට්ටුම පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධරයා වෙත භාර දිය යුතු ය " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය සංශෝධනය කිරීම.

**25.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය එහි " රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට හෝ " යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය තෙක් වූ වචන වෙනුවට "රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකට හෝ දෙවන වතාවට හෝ තදනන්තරව වරදකරු කරනු ලැබූ විට අවුරුදු දහයක් නොඉක්මවන කාලයකට දෙආකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමෙන් හෝ රුපියල් දසදහසක් නොඉක්මවන දඩයකින් හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දණ්ඩන දෙකින්ම හෝ දඬුවම් කරනු ලැබිය හැකි ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 44අ සහ 44ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**26.** ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන වගන්ති ඇතුළත් කරනු ලබන අතර, ඒවා පිළිවෙළින්, ඒ ප්‍රඥප්තියේ 44අ සහ 44ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:—

"ඇ" උපලේඛනයේ නිශ්චිතව දක්වෙන වැරදි සඳහා දණ්ඩන.

44අ. මේ ආඥපනතේ හෝ වෙනත් යම් නීතියක කවර විධිවිධානයක් තිබුණ ද, මේ ආඥපනතේ "ඇ" උපලේඛනයේ නිශ්චිතව දක්වෙන වරදක් කිරීම සඳහා තුවක්කුවක් පාවිච්චි කරන යම් තැනැත්තකු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, මරණීය දණ්ඩනයෙන් හෝ ජීවිතාන්තය දක්වා බන්ධනාගාරගත කරනු ලැබීමෙන් හෝ දඬුවම් කරනු ලැබිය යුතු අතර, රුපියල් විසිදහසක් නොඉක්මවන දඩයකින් දඬුවම් කරනු ලැබීමට ද යටත් විය යුතු ය.

"ඇ" උපලේඛනයේ නිශ්චිතව දක්වෙන වැරදි සඳහා දණ්ඩන.

44ආ. මේ ආඥපනතේ හෝ වෙනත් යම් නීතියක කවර විධිවිධානයක් තිබුණ ද, මේ ආඥපනතේ "ඇ" උපලේඛනයේ නිශ්චිතව දක්වෙන වරදක් කිරීම සඳහා තුවක්කුවක් පාවිච්චි කරන යම් තැනැත්තකු ඒ වරද සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, අවුරුදු පහළොවකට නොඅඩු කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමෙන් හෝ රුපියල් විසිදහසක් නොඉක්මවන දඩයකින් හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකින් ම හෝ ඔහුට දඬුවම් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

**27.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ " පොලිස්පතිවරයාගේ අත්සනින් " යන වචන වෙනුවට " ලේකම්වරයාගේ අත්සනින් " යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

[illegible]. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට, මෙහි පහත දක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ඇතැම් කර්තව්‍ය පවරා දීමට බලපත්‍ර අධිකාරීවරයාට ඇති බලය.

51. යම් බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් තමන් වෙනුවෙන් ප්‍රදානය කිරීමේ සහ අත්සන් කිරීමේ බලය, බලපත්‍ර අධිකාරී විසින් යම් පරිපාලන දිස්ත්‍රික්කයක් භාර දිස්ත්‍රික් ලේකම්වරයාට පවරා දිය හැකි ය. එසේ පවරා දෙන බලය දිස්ත්‍රික් ලේකම්වරයා විසින් කොට්ඨාසයේ පොලිස් අධිකාරීවරයා විමසා ක්‍රියාවේ යෙදිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට 51අ සහ 51 ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

[illegible]. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ඒ ප්‍රඥප්තියේ 51අ සහ 51ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

"රජය බැඳීමට යෙදීම.

51අ. මේ ආඥාපනතේ විධිවිධානවලින් රජය හෝ රජයේ යම් නියෝජිත ආයතනයක් හෝ බැඳී සිටින්නේ ය.

නියෝග.

51ආ. (1) මේ ආඥාපනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා හෝ නියම කළ යුතු යයි මේ ආඥාපනතින් නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට මේ ආඥාපනතින් බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ විට හෝ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු අනුමතය සඳහා හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම, ඒ යටතේ කලින් කර ඇති කිසිවකට හානියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ සේ සැලකිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 'අ' උපලේඛනය සංශෝධනය කිරීම.

[illegible]. ප්‍රධාන ප්‍රඥප්තියේ 'අ' උපලේඛනය, මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එහි 'ආ1' ආකෘති පත්‍රයේ "පොලිස් අධිකාරී කොළඹ" යන වචන වෙනුවට "රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එහි 'ආ2' ආකෘති පත්‍රයේ "ජ්‍යෙෂ්ඨ අධිකාරී" යන වචන වෙනුවට "රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එහි 'ඈ' ආකෘති පත්‍රයේ "රේගු අයකැමි" යන වචන වෙනුවට "රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) එහි 'ඇ' ආකෘති පත්‍රයේ "දිසාපති" යන වචනය යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඉ) එහි 'ඌ' ආකෘති පත්‍රයේ "දිසාපති" යන වචනය යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඊ) එහි 'ඒ' ආකෘති පත්‍රයේ "දිසාපති" යන වචනය යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්" යන වචන ආදේශ කිරීමෙන් ;

(උ) එහි 'ක' ආකෘති පත්‍රයේ "දිසාපති" යන වචනය වෙනුවට "බලපත්‍ර අධිකාරී" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඌ) එහි 'ච' ආකෘති පත්‍රයේ "දිසාපති" යන වචනය යෙදෙන සෑම තැනකම ඒ වෙනුවට "රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 'ඇ' සහ 'ඈ' නව අලුත් උපලේඛන ඇතුළත් කිරීම.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 'ආ' උපලේඛනයට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් උපලේඛන මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා පිළිවෙලින් ඒ ප්‍රඥප්තියේ 'ඇ' සහ 'ඈ' උපලේඛන ලෙස බලාත්මක විය යුතු ය :—

"ඇ" උපලේඛනය (44 අ වගන්තිය)

| දණ්ඩ නීති සංග්‍රහයේ වගන්තිය | වරදේ ස්වභාවය |
|---|---|
| 114—123 (එම වගන්ති දෙකම ඇතුළුව) | රජයට විරුද්ධ වැරදි. |
| 126—133 (එම වගන්ති දෙකම ඇතුළුව) | යුද හමුදාව, නාවුක හමුදාව හා ගුවන් හමුදාව සම්බන්ධ වැරදි. |
| 296, 297, 300 සහ 301 | සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය යනාදිය |
| 315—324 (එම වගන්ති දෙකම ඇතුළුව) | අන්තරායදායක ආයුධවලින්, ස්වෙච්ඡාවෙන් තුවාල කිරීම |
| 344, 345 සහ 347 | සාපරාධී බලහත්කාරය |
| 373—378 (එම වගන්ති දෙකම ඇතුළුව) | ත්‍රාසාද්ග්‍රහණය |
| 380—385 ( එම වගන්ති දෙකම ඇතුළුව) | කොල්ලකෑම |
| 354—360අ | අපහරණය සහ පැහැරගෙන යාම |
| 364 | ස්ත්‍රී දූෂණය |
| 364අ | ලාබාල ගැහැණු ළමුන් සමග කාම සංසර්ගය |
| 101—150 | මේ උපලේඛනයේ සඳහන් දණ්ඩ නීති සංග්‍රහයේ ඉහත සඳහන් වගන්තිවලට විරුද්ධ යම් වරදක් කිරීමට අනුබල දීම හා තැත් කිරීම |
| විෂ, අබිං හා අන්තරායදායක ඖෂධ ආඥා පනත යටතේ වැරදි | විෂ, අබිං හා අන්තරායදායක ඖෂධ ආඥාපනත යටතේ කරන ලද ඖෂධ හා සම්බන්ධව සියලු වැරදි. |

'ආ' උපලේඛනය (44ආ වගන්තිය)

| දණ්ඩ නීති සංග්‍රහයේ වගන්තිය | වරදේ ස්වභාවය |
|---|---|
| 140, 141, 142, 144 සහ 145 වගන්ති | නීති විරෝධී රංචුගැසීම සහ කැරලි ගැසීම |
| 219, 219අ, 220 සහ 220අ | නීත්‍යනුකූල අත්අඩංගුවට ගැනීමට ප්‍රතිරෝධය පෑම |
| 411—426 (එම වගන්ති දෙකම ඇතුළුව) | අනර්ථය |
| [illegible]—451 (එම වගන්ති දෙකම ඇතුළුව) | රැක සිට ගෙයකට අයුතු ලෙස ඇතුළුවීම ; ගෙවල් බිඳීම යනාදිය |
| 486 | සාපරාධී බියගැන්වීම |
| 101—490 | මේ උපලේඛනයේ සඳහන් දණ්ඩ නීති සංග්‍රහයේ වගන්තිවලට විරුද්ධ යම් වරදක් කිරීමට අනුබල දීම හා තැත් කිරීම |
| 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 2(1) (අ) සහ (ආ) වගන්ති යටතේ වැරදි | නිශ්චිත තැනැත්තන්ට විරුද්ධ වැරදි". |

45. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.